# නාථ දේව වන්දනයේ අරමුණු හඳුනා ගැනීම

**ටී.ජී.ඒ. තල්වත්ත**
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
*ajiththalwatte@gmail.com*

යතුරු පද : මහායානය, අවලෝකිතේශ්වර, මෛත්‍රී, සතරවරම් දෙවිවරු

**හැඳින්වීම**

මෙම පර්යේෂණය "නාථ දේව වන්දනයේ ජනතා අරමුණු" යන මාතෘකාව මත පදනම් ව සිදුකරන අධ්‍යයනයකි.මහායාන බුදුදහම තුළ අවධානයට ලක්වන ප්‍රධාන ලක්ෂණයක් නම් බෝධිසත්ව වන්දනාවයි. මේ රටට ඇති වූ මහායාන බලපෑම නිසා බෝධිසත්ව ඇදහීම ප්‍රචලිත විය. මෙරට ප්‍රචලිත වූ බෝධිසත්වරු අතර අවලෝකිතේශ්වර නාථට විශේෂ ස්ථානයක් හිමි වේ. ක්‍රමික විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස අවලෝකිතේශ්වර නාථ 14 වැනි සියවස වනවිට මෙරට ජනතාවගේ ගෞරවයට ලෝකේශ්වර නාථ වශයෙනි. උන්වහන්සේ මහනුවර යුගය වන විට නාථ දෙවියන් බවට පත්විය. එදා සිට අද දක්වා ම මහනුවර ප්‍රදේශයේ නාථ වන්දනය ජනප්‍රියව තිබේ. නවීකරණය හා තාක්ෂණ ඥානය ශීඝ්‍රයෙන් වර්ධනය වන නූතන සමාජය තුළ ලෞකික අපෙක්ෂා මුදුන් පමුණුවා ගැනීමට විධිමත් හා අවිධිමත් උපක්‍රම ප්‍රබලව යොදාගන්නා බව පැහැදිලි ය. මුල් අවධියේ යහපත් ප්‍රාර්ථනාවන්ගෙන් යුක්ත වූ එම ජීවිත අපේක්ෂා බුදුදහම හා සෘජුව බැඳී පැවති බව පැහැදිලි වේ. ජන සමාජයේ සතරවරම් දෙවිවරුන් ප්‍රධාන වූ දේව සමූහයට ප්‍රමුඛ ස්ථානයක් හිමිව තිබුයේ පොදු ජනතාවගේ යහපත් ප්‍රාර්ථනා ඉටුකර ගැනීමට ය. පසු කාලයේ යහපත් මෙන් ම අයහපත් ප්‍රාර්ථනාවන් සඳහා ද ඔවුන් දෙවියන්ගේ පිහිට අපේක්ෂා කර ඇත. බෞද්ධාගමික සංකල්ප හා බැඳි දේව විශ්වාස මගින් ඒවා ඉටු කර ගැනීමට නොහැකි වූ කල්හි වෙනත් දේව සංකල්ප නිර්මාණය කර ගැනීමට ඔවුහු පෙළඹුණහ. පිහිට අපේක්ෂාවෙන් ජනතාව අතර ප්‍රචලිත වූ දේව සංකල්පයක් ලෙස නාථ දෙවියන් සඳහන් කළ හැකිය. නාථ දෙවියන් ලෙස වර්ධනය වීමට ප්‍රථම බෝධිසත්වයකු ලෙස පිදුම් ලැබූ අවධියේ ජනතාව අවලෝකිතේශ්වර වන්දනය තුළින් ලෞකික හා ලෝකෝත්තර යනුවෙන් අපේක්ෂා දෙකක් සාක්ෂාත් කරගැනීමට උත්සාහ කළෝ ය. එහි ලෞකික පාර්ශවය ඉස්මතු වීම තුළින් නාථ දේව සංකල්පය බිහි විය.

**අරමුණු**

නාථ දේව වන්දනයේ ජනතා අරමුණු යන්න ප්‍රධාන අරමුණු කිහිපයක් මත පදනම් ව කටයුතු කිරීමට අපෙක්ෂිතය. මහායාන බුද්ධදහම තුළ අවධානයට ලක්වන ප්‍රධාන ලක්ෂණයක් ලෙස බෝධිසත්ත්ව වන්දනයේ ප්‍රභවය හඳුනාගෙන, එය කෙසේ මෙරට තුළ ස්ථාපිත වූයේ ද, මහායානය තුළින් වර්ධනය වූ අවලෝකිතේශ්වර සංකල්පය විකාශනයවීම, අවලෝකිතේශ්වර නාථ මහනුවර යුගයේ දී නාථ දෙවියන් මෛත්‍රී බෝධිසත්ත්වයන් හා බද්ධ ව එක දෙවි කෙනෙකු ලෙස පෙනී සිටියේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම, නාථ දේව වන්දනය තුළින් ජනතාව ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අපේක්ෂා කවරේ ද යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු වේ.

**ක්‍රමවේදය**

නාථ දේව වන්දනයේ ජනතා අරමුණු යන පර්යේෂණය සිදුකිරීමේ දී තොරතුරු ලබාගැනීම පිණිස අනුගමනය කරන පර්යේෂණ ක්‍රමවේදය හා මූලාශ්‍ර ද වැදගත් වේ. මේ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමේ දී පුස්තකාල හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන ද යොදා ගැනීමට ද අපේක්ෂිත ය. තොරතුරු ලබාගැනීමේ දී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර යොදාගන්නා අතර ජනශ්‍රැති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

**විමර්ශනය**

හත් වැනි සියවසේ සිට මෙරට බෞද්ධයන් අතර ගෞරව බහුමානයට පාත්‍ර වූ අවලෝකිතේශ්වර බෝසතුන් අවලෝකිතේශ්වර නාථ, ලෝකේශ්වර නාථ හෝ නාථ නමින් දේවත්වයට පත්වූ බව පෙනේ. මහනුවර යුගයේ දී නාථ දෙවියන් මෛත්‍රී බෝධිසත්ත්වයන් හා බද්ධව එක දෙවි කෙනෙකු ලෙස පෙනී සිටීම ද කැපී පෙනේ. ලෞකික අරමුණුවලින් බැහැරව ලෝකෝත්තර අපේක්ෂා ඉටුකර දෙන දෙවියෙකු ලෙස උන්වහන්සේ පත්ව ඇත.නූතන සමාජ ක්‍රමය තුළ මිනිසා පිඩා විඳින්නේ පොදු සමාජ ප්‍රශ්න විසඳාගැනීමට වඩා පෞද්ගලික අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ය. සමාජයේ පවතින අසමතුලිතතාව තුළින් පීඩාවට පත් ජනතාව තම අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීමට දෙවියන් කරා යොමුවී තිබේ. ශීඝ්‍රයෙන් නවීකරණය වන සමාජ හා ආර්ථික සන්දර්භය තුළ මිනිසාට විවිධාකාර ගැටලුවලට මුහුණ දීමට සිදුවේ. මෙම ගැටලු මිනිසාට ඔරොත්තු නොදෙන තරම් ය. උද්ගතව ඇති ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ දී යුක්තිය, සධාරණත්වය නිසි පරිදි ඉටුවන්නේ ස්වල්ප දෙනෙකුට පමණි. මෙවන් තත්ත්වයක් යටතේ අදෘශ්‍යමාන බලවේග විකල්ප මාර්ග ලෙස යොදා ගැනීමට සිටින දෙවිවරුන්ට මේ නිසා ඔවුහු විවිධ පුදපූජා පවත්වති. සිංහල බෞද්ධ සමාජයෙහි දේව විශ්වාස පැරණි යුගවල තිබූ දේව විශ්වාසවලින් වෙනස් වන තැන් කිහිපයකි. ප්‍රධාන ම වෙනස ලෙස පෙනෙන්නේ අතීතයේ තරම් දෙවිවරුන් ගැන

විශ්වාසය නැතිවීමයි. නූතන තාක්ෂණික ඥානය හා නව ශිෂ්ටාචාරයේ විවිධ පහසුකම් තවත් හේතුවකි. එබැවින් දෙවියන්ගේ පිහිටෙන් තොර ව මිනිසුන්ගේ ප්‍රශ්න විසදාගත හැකි ය යන අදහස පවති. තවද බෞද්ධයා වඩවඩාත් බුදුන් වහන්සේගේ මූලික දහම් කරුණු කෙරෙහි වැඩි නැඹුරුවීමක් දැක්වීම ද දේව විශ්වාස ජනතාවගෙන් දුරස් ව යාමට හේතුවක් වී ඇත.

අතීතයේ ජනතාව නාථ දෙවියන්ගෙන් රෝග සුව කිරීම, වසන්ගත රෝගවලින් ආරක්ෂා කිරීම වැනි අපෙක්ෂා ඉටුකර ගත්තේය. මෙම අධ්‍යයනයට භාජනය කළ නාථ දේවාල වන මහනුවර, වේගිරිය, දොඩම්වල, හා පස්ගම යන නාථ දේවාල තුළින් ජනතා අපේක්ෂා වන්නේ රෝග සුව වීම, භව භෝග සරු වීම, දරුඵල අපේක්ෂාව, විභාග ජයග්‍රහණය කිරීම, විදේශ ගමන් සාර්ථක කරගැනීම, අතුරුදහන් වූවන් සොයා ගැනීම, වැරදිකරුවන්ට දඬුවම් කිරීම යන කරුණුවලට මුල් තැන ලබාදේ. මේ තුළින් පැහැදිලි වන්නේ ලෞකික අපේක්ෂා හමුවේ දේව පිහිට පැතිමට බොහෝ දෙනෙකු පෙළඹී ඇති බවය. වර්තමානයේ නාථ දෙවියන් හා බෞද්ධාගම අතර, සමීප සබඳතාවක් ගොඩනැගී පවතී. ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අනාගතයේ බුදුබව ලබා ගැනීමට විවරණ ලබා ඇත්තේ නාථ දෙවියන් නිසාය. බෞද්ධ ජන සමාජයෙහි කවර හෝ ආගමික කාර්යයක් අවසානයේ දී පින් අනුමෝදන් කිරීමේ දී ප්‍රාර්ථනා කරන්නේ අනාගතයේ මතු බුදුවන නාථ දෙවියන් හෙවත් මෛත්‍රී බුදුන් හමුවේ දහම් අසා නිවන් සාක්ෂාත් කර ගැනීමයි. මෙරට දේව ධූරාවලියේ ලෞකික සහ ලෝකෝත්තර අරමුණු ඉටුකරගත හැකි එකම දෙවියා වන්නේ නාථ ය. තවද උන්වහන්සේ බෝධිසත්වයෙකු වශයෙන් සිට දේවත්වයට පත්වී නැවත බෝධිසත්වයෙක් වූයේ උන්වහන්සේ පමණි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


***නිකාය සංග්‍රහය,*** 1997. සංස්. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

***මහාවංශය,*** 1912, සංස්. හික්කඩුවේ සුමංගලලාභිධාන හිමි, සහ දොන් අන්ද්‍රිස් බටුවන්තුඩාවේ, පරි. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.

***සමන්තපාසාදිකා,*** 1929, සංස්. පියරතන මහා ස්ථවිර සහ සෝරත ස්ථවිර, හේවාවිතාරණ මුද්‍රණාලය, කොළඹ.

***සිංහල කතිකාවත් සහ භික්ෂු සමාජය,*** 1972, සංස්. ඒ.වී. සුරවීර, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ඉලංගසිංහ, මංගල, **මධ්‍ය කාලීන ලංකාවේ** ආගම, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2005.

සාසනරතන, මොරටුවේ, 1952, ***ලක්දිව මහායාන අදහස්,*** විසිදුන ප්‍රකාශන, කොළඹ.

හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, 1991, ***මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පූරාණය,*** පරි. පී.බී. මීගස්කුඹුර ප්‍රදීප ප්‍රකාශන, කොළඹ.

Mudiyanse, Nandasena, 1965, ***Mahayana Monuments in Ceylon,*** M .D .Gunasena and Co. Colombo.